සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

01. දේශපාලන ගැටලු පදනම් කරගෙන බිහි වුණු අකීදාකොටස
(1) මුහ්තසිලා (2) මුර්ජියා (3) කද්රිය්යා (4) ෂීආ

02. අපි සියලුම සලාත්වල පාරායනය කරන "මාලිකි යව්මිද්දීන්" යන්නෙහි අරුත
(1) අසීමිත දයාවන්තයා (2) ඔබ විතරයි නමදිමු
(3) අවසන් දින අධිපති (4) ඍජු මාර්ගය දෙනු මැනව

03. ඉස්මත් යන ගුණය ලැබූ අය
(1) මුස්ලිම්වරු (2) රසූල්වරු (3) මලක්වරු (4) වලීවරු

04. පාප ක්‍රියාවක් පාප නොවන බව සිතීමෙන් කුමක් ඇති වෙයිද
(1) ෂිර්ක් (2) කුෆ්ර් (3) රිද්දත් (4) ඉල්හාද්

05. පියවී ඇසට ගෝචර නොවන මලක්වරුන්, ජින්වරුන්, ෂෛතාන්වරුන් අඩංගු වන කොටස
(1) අල් ඉලාහියාත් (2) අන් නුබුව්වාත් (3) අස් සම්ඉයියාත් (4) අර් රූහානියියාත්

06. ආගම්වලට පෙර පහළ කරන ලද සුහුෆ් සංඛ්‍යාව
(1) 50 (2) 100 (3) 110 (3) 210

07. පොළොව සශ්‍රීක කරන කටයුත්තෙහි අරාබි වැකිය
(1) කිලාපත් (2) ඉමාරත් (3) ඉබාදත් (4) ඉරාදත්

08. තයම්මුම් කිරීමට භාවිතා කරන ශරීර අවයව ගණන
(1) 02 (2) 03 (3) 04 (4) 05

09. සලාතය ඉටුකිරීමේ දී කිබ්ලාවට මුහුණලා සිටීම සම්බන්ධ ඉස්ලාමීය තීන්දුව
(1) පර්ල් (2) සුන්නත් (3) මුබාහ් (4) සර්ත්

10. බිරිඳ සැමියාගෙන් විවාහ බන්ධයෙන් නිදහස් ඉල්ලා සිටීම
(1) පස්හු (2) කුල්උ (3) තලාක් (3) ලිආන්

11. නබි (සල්) තුමානන් සලාතය ඉටුකිරීමෙන් පසුව පළමුවෙන් පාරායනය කරන වචනය
(1) අස්තහ්පිරුල්ලාහ් (2) සුබ්හානල්ලාහ් (3) අස්සලාමු අලෙයිකුම් (4) ලා ඉලාහ ඉල්ලල්ලාහ්

12. අල් මුඃති යන්නෙහි අරුතය
(1) දානපතියා (2) දයාවන්තයා (3) ධනපතියකු කරන්නා (4) ආහාර සැපයන්නා

13. පිළිවෙත් සුරැකීම යන්නෙහි අරාබි වැකිය

(1) තක්වා (2) තව්බා (3) සුහ්ද් (4) වරඋ

14. ෆර්ලු කිෆායා යන්නෙහි අදහස

(1) සියලුම මුස්ලිම්වරු අනිවාර්යයෙන්ම ඉටු කළ යුතු දේ

(2) සාමූහික වශයෙන් ඉටුකළයුතු දේ

(3) කැමැත්ත අනුව කළ හැකියි

(4) සමාජයේ කිහිප දෙනෙකු හරි අනිවාර්යයෙන්ම ඉටුකළ යුතු දේ

15. අල්ලාහ් අනුමත කළ දේ අතරින් ඔහුට ඉතාම පිළිකුල් සහගත ක්‍රියාව

(1) වෙළඳාම (2) තලාක් (3) බහු භාර්‍ය විවාහ (4) බාරය

16. අල්කුර්ආනය ලස්සනට අර්ථාන්විතව පාරායනය කරන්නා

(1) කාරි (2) හාපිල් (3) ඉමාම් (4) මුඅල්ලිම්

17. ඉස්ලාමීය නීති විද්වතුන් හඳුන්වනු ලබන්නේ

(1) මුෆස්සිර් (2) මුහද්දිස් (3) පකීහ් (4) ආලිම්

18. කියාස් මූලාශ්‍රයේ සසඳා බැලීම හඳුන්වනු ලබන්නේ

(1) අස්ල් (2) පර්උ (3) හුක්ම් (4) ඉල්ලත්

19. වයස දෙකක් සම්පූර්ණ නොවූ අනස් යන දරුවා මව්කිරි සමඟ පළතුරු ආහාරයට ගනී. මෙම දරුවාගේ මුත්‍රා කුමන නජීස් වර්ගයට අයත්වේද?

(1) දැඩි නජීස් (2) සාමාන්‍ය නජීස් (3) මෘදු නජීස් (4) නජීස් නොවේ

20. පහත (අ) තීරුවේ සඳහන් සහාය මූලාශ්‍ර සමග ගැලපී (ආ) තීරුවේ අර්ථය සමග සම්බන්ධ කරන නිවැරදි උත්තරය

| (අ) | (ආ) |
|---|---|
| 1. කව්ලුස් සහාබ් | A. ඒකමතික තීරණය |
| 2. ඉස්තිස්ලාහ් | B. පාරම්පරික ක්‍රියා |
| 3. උර්පු | C. සහාබාවරුන්ගේ අදහස |
| 4. ඉජ්මා | D. සමාජ සුභ සිද්ධිය රැකීම |

(1) ABCD (2) ACBD (3) DCBA (4) CDBA

21. හදීස් ග්‍රන්ථාරූඪ කිරීමේ ප්‍රයත්නය රාජ්‍ය මෙහෙවරක් වශයෙන් ක්‍රියාත්මක කළ රාජ්‍ය පාලකයා

(1) කලීපා අලි (රලි) (2) මුආවියා (රලි)

(3) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) (4) ඉමාම් සුහ්රි (රහ්)

22. අරාබිකරයේ නැගෙනහිර මායිම්ම පිහිටා ඇත්තේ

(1) පර්සියානු බොක්ක (2) සිරියානු කාන්තාරය (3) අරාබි මුහුද (4) රතු මුහුද

23. ජාහිලියියා කාලයේ ගෝත්‍ර අතර පැවති දීර්ඝ කාලීන සටන

(1) ශුඋඃබ් (2) කබීලා (3) පඋඃස් (4) අසබියියා

24. නබි (සල්) තුමාගේ මුල් අවුරුදු තුන රහසිගතව ප්‍රචාරය කර ඉස්ලාමය පිළිගත් අයට අධ්‍යාත්මික පුහුණුව (තර්බියා) ලබා දුන් ස්ථානය
(1) දාරුල් නද්වා (2) දාරුල් හික්මා (3) දාරුල් කරාර් (4) දාරුල් අර්කම්

25. නබි (සල්) තුමා නුබුව්වත් 05 වන වසරේ දී හබසාවට පිට මං කළ මිතුරන්ගේ සංඛ්‍යාව
(1) 4 (2) 10 (3) 100 (4) 15

26. හුදයිබියියා ගිවිසුම සිදුවූ හිජ්රි වර්ෂය
(1) 6 (2) 8 (3) 10 (4) 11

27. නබි (සල් තුමාගේ සීරාව (ජීවන කථාව) ප්‍රථමයෙන්ම ලේඛණ ගත කළ ලේඛකයා
(1) මුහම්මද් අබ්දුල් මලික් බින් හිෂාම් (2) මුහම්මද් බින් ඉස්හාක්
(3) ඉමාම් තබරි (රහ්) (4) ඉමාම් බුහාරි (රහ්)

28. ස්පෙයින් රට ජයග්‍රහණය කළ හමුදාපති
(1) මුහම්මද් බින් කාසිම් (2) මුහම්මද් අල් ෆාතිහ්
(3) තාරික් බින් සියාද් (4) උසාමා බින් සෛද් (රලි)

29. මන්නු සල්වා යන ආහාරය පහළ වූ සමාජයේ නබිතුමා
(1) නබි ඊසා (අලෛ) (2) නබි සාලිහ් (අලෛ) (3) නබි නූහ් (අලෛ) (4) නබි මූසා (අලෛ)

30. රිසානා දෙදරු මවකි. විවාහ වී වසර පහක් තුළ පුරුෂයාගෙන් දික්කසාද වූ ඇයගේ ඉද්දා කාලය සම්බන්ධව ඔබගේ යෝජනාව කුමක් ද?
(1) මාස තුන (2) මාස හතර (3) මාස හතරයි දින දහයයි (4) ඉද්දා අවශ්‍ය නොවේ

31. පුරුෂයෙකු තමාගේ බිරිඳට ලබාදෙන ජීවන වියදම
(1) කිස්වා (2) නෆකා (3) සහන් (4) ජිස්යා

32. ''මෙලොව ජීවිතයෙහි කෙළි සෙල්ලමත් විනෝදයත් මිස අන් කිසිවක් නැත. සැබවින්ම බිය බැතිමත් අයට පරලොව ඉතා හොඳය යන වැකිය''
(1) හදීස් (2) සහාබිවරුන්ගේ අදහසකි
(3) අල්කුර් ආන් (4) කියමනකි

33. කුත්බා දේශනාව නොමැති ආගමික ක්‍රියාව
(1) ඊද් සලාතය (2) නිකාහ් මජ්ලිස් (3) ග්‍රහණ සලාතය (4) හල්කා මජ්ලිස්

34. ඉමාම් ෂාෆිඊ (රහ්) තුමාගේ අන්‍ය නාමය
(1) ආලිමුල් කුරෛෂ් (2) ඉමාමුල් මදීනා
(3) ඉමාමුල් අහ්ලම් (4) ඉමාමුල් උම්මත්

35. හසන් ප්‍රබල ව්‍යාපාරිකයෙකි 2018 සිට 2019 දක්වා වර්ෂයක කාලය තුළ ඔහුගේ මුළු වෙළඳ භාණ්ඩ වල වටිනාකම රුපියල් ලක්ෂ පහකි. එක් පවුමක වටිනාකම රු. 50 000 ක් නම් ඔහුගේ සකාත් පිළිබඳව ඔබගේ විසඳුම කුමක් ද?
(1) රු. 10 000/- (2) රු. 20 000/-
(3) සකාත අනිවාර්ය නොවේ (4) රු. 12 500/-

36. පහත සඳහන් අය අතර අජ්නබි ස්ත්‍රිය
(1) කිරිදුන් ස්ත්‍රිය (2) නැන්දාගේ දුව (3) බිරිඳගේ මව (4) පුතාගේ බිරිඳ

37. මුස්ලිම් නේෂන් සහ ඥානදීපය නම් සඟරා පළකළ කතුවරයා
(1) සිද්දි ලෙබ්බේ (2) ටී.බී. ජායා (3) විනිසුරු අක්බර් (4) මාප්පිල්ලයි ආලිම්

38. අබ්බාසියා කලීෆා විසින් ලංකාවට එවනු ලැබූ ආගමික උපදේශක
(1) අල් බලාදුරි (2) කාලිද් ඉබ්නු බකායා (3) අරාබි භාෂා (4) හජ්ජාජ්

39. ප්‍රාග්ධනය ඇත්තා ප්‍රාග්ධනය යොදවන අතර ව්‍යවසායකයා තම දැනුම හා අත් දැකීම් භාවිතා කරන ව්‍යාපාර ක්‍රමය
(1) මුරා බහා (2) මුෂාරකා (3) මුෂාරආා (4) මුලාරබ

40. කල්බුල් කුර් ආන් යනු සූරාව
(1) ෆාතිහා (2) බකරා (3) යාසීන් (4) කහ්ෆු

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **ඉස්ලාම් ධර්මය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

(01) කෙටි උත්තර ලියන්න.

(i) හජ් හා උම්රා යන අමල් සිදු කරන අවස්ථාවේ දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න.
(ii) ෂිර්ක් හි වර්ග දෙකම ලියන්න.
(iii) හදීස් ක්ෂේත්‍රයට දායක වූ ඉමාම්වරු දෙදෙනෙකුගේ නම් ලියන්න.
(iv) නබි මූසා (අලෛ) තුමාට පහළ කරන ලද ආශ්චර්ය (මුඃජිසාත්) දෙකක් ලියන්න.
(v) ඉතිහාසය තුළ බිහි වූ ව්‍යාජ නබිවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.
(vi) ඉස්ලාම් තහනම් කළ ඉපැයුම් ක්‍රම දෙකක් ලියන්න.
(vii) උපවාසයෙන් ලැබෙන ලෞකික ප්‍රයෝජන දෙකක් ලියන්න.
(viii) ශුද්ධ වූ කඃබාව ගොඩනැගීමට දායක වූ නබිවරු දෙදෙනෙකුගේ නම් ලියන්න.
(ix) යහ ගුණාංග සඳහන් වන අල්කුර්ආන් වැකියක අර්ථය ලියන්න.
(x) ඉබාදත්හි වර්ග දෙකම කුමක් ද? (ලකුණු 2 x 10 = 20)

(02) (i) අහ්ලුස් සුන්නා වල් ජමාආ යන්නෙන් පැහැදිලි වන්නේ කුමක් ද?
(ii) අකීදාව ආරක්ෂා කිරීමට සහයෝගය ලබාදුන් ඉමාම්වරු තුන් දෙනෙකු සඳහන් කරන්න.
(iii) ඉල්මුල් අකීදා බිහි වීමට හේතු වූ පසු බිම සඳහන් කරන්න.
(ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) කුත්තාබුල් වහි යනු කුමක් ද?
(ii) කලීෆා අබු බකර් (රලි) තුමාගේ අල් කුර් ආන් ගොනු කිරීමේ මෙහෙවරය පැහැදිලි කරන්න.
(iii) අල්කුර්ආනය ගොනු කිරීමට සෙද් බින් සාබිත් (රලි) තුමාගේ දායකත්වය පැහැදිලි කරන්න.
(ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) සකාතයේ ෆර්ලු කුමක් ද?
(ii) සකාත් ලැබීමට හිමිකම් ඇති කාණ්ඩ හයක් ලියන්න.
(iii) සකාත් සාමූහික වශයෙන් ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න.
(ලකුණු 2 + 3 + 5 = 10)

(05) (i) " අල් කුලෆාඋර් රාසිදූන්" යනු කුමක් ද?
(ii) කලීෆා උමර් (රලි) තුමාගේ පෞරුෂ ගුණාංග තුනක් පැහැදිලි කරන්න.
(iii) කලීෆා අබුබක්කර් (රලි) තුමා තමාගේ රාජ්‍යයට ඉටු කර (කිලාෆත්) දායකත්වය පහක් සඳහන් කරන්න.
(ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) ඉස්ලාමීය ෂරීආවේ දැක්මෙන් විවාහයේ අරමුණු දෙකක් ලියන්න.
(ii) විවාහ අනුමත වීමට අවශ්‍ය වන කොන්දේසි තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) ඉස්ලාම් දේශනා කළ ඉපයීමේ දී තහනම් කළ දේ අතරින් පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) මස්ජිදුන් නබවි
(ii) තස්කියා
(iii) ජලය හා එහි වර්ග
(iv) ඉස්ලාම් ලබා දී ඇති මානව අයිතිවාසිකම්
(ලකුණු 2 + 3 + 5 = 10)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -( ) | 2 -( ) | 3 -( ) | 4 -( ) | 5 -( ) | 6 -( ) | 7 -( ) | 8 -( ) | 9 -( ) | 10 -( ) |
| 11 -( ) | 12 -( ) | 13 -( ) | 14 -( ) | 15 -( ) | 16 -( ) | 17 -( ) | 18 -( ) | 19 -( ) | 20 -( ) |
| 21 -( ) | 22 -( ) | 23 -( ) | 24 -( ) | 25 -( ) | 26 -( ) | 27 -( ) | 28 -( ) | 29 -( ) | 30 -( ) |
| 31 -( ) | 32 -( ) | 33 -( ) | 34 -( ) | 35 -( ) | 36 -( ) | 37 -( ) | 38 -( ) | 39 -( ) | 40 -( ) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) (i)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(2) | 4 -(2) | 5 -(4) | 6 -(3) | 7 -(2) | 8 -(1) | 9 -(4) | 10-(2) |
| 11-(1) | 12-(3) | 13-(4) | 14-(4) | 15-(2) | 16-(1) | 17-(3) | 18-(1) | 19-(2) | 20-(4) |
| 21-(3) | 22-(1) | 23-(3) | 24-(4) | 25-(4) | 26-(1) | 27-(2) | 28-(3) | 29-(4) | 30-(1) |
| 31-(2) | 32-(3) | 33-(4) | 34-(1) | 35-(3) | 36-(2) | 37-(1) | 38-(2) | 39-(4) | 40-(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) අරෆාහි රැඳීම, මිනා හා මුස්තලිෆාවේ රැඳී සිටීම / ජම්රාවල ගල් විසිකිරීම

(ii) ෂිර්කුල් අක්බර්, ෂිර්කුල් අස්කර්

(iii) ඉමාම් බුහාරි(රහ්), ඉමාම් මුස්ලිම් (රහ්) / ඉමාම් තිර්මිදි (රහ්), / ඉමාම් නසායි (රහ්) /ඉමාම් ඉබුනු මාජා (රහ්), ඉමාම් අබුදාවුද් (රහ්) යන අයගෙන් දෙන්නෙක්

(iv) පොල්ල ෂර්පයක් වීම, දිලිසෙන අත

(v) අස්වතුල් අන්සි, මුසයිලමා, සජාහ්, දුලයිහා

(vi) පොලිය, භාණ්ඩ සැඟවීම, මිශ්‍ර කිරීම, වංචා යන ක්‍රියාවල දෙකක්

(vii) ශාරීරික නිරෝගී බව හිමිවීම / දුගීන්ගේ දුෂ්කරතා හඳුනා ගැනීම / සහෝදරත්ව හැඟීම් පෙන්වීම

(viii) නබි ඉබ්‍රාහීම් (අලෛ) නබි ඉස්මායීල් (අලෛ)

(ix) ''තවද නියත වශයෙන් නුඹ අතිශ්‍රේෂ්ඨ වූ යහගුණයන්ගෙන් හෙබීය'' යන ගුණාංග ලක්ෂණ ගෙනහැර දක්වන වචන

(x) පර්ල් අයින්, පර්ල් කිපායා

(02) (i) අහ්ලුස් සුන්නා වල් ජමාආ යනු නබිතුමා ද එතුමාගේ මිත්‍රවරුන් ද ජීවත් වූ ක්‍රම අනුගමනය කිරීම වේ.

(ii) ඉමාම් අහ්මද් බින් හන්බල් (රහ්), ඉමාම් අබුල් හසන් අල් අෂ්අරි (අහ්), ඉමාම් අබූ මන්සූර් අල් මාතුරුදි (රහ්), ඉමාම් දහාවි (රහ්)

(iii)
- ★ ස්ව කැමැත්ත අනුව ක්‍රියා කිරීම.
- ★ විචාර බුද්ධියෙහි සීමාව ඉක්ම වීම.
- ★ දේශපාලනික අර්බුද.
- ★ අන්‍ය චින්තනයන්ගේ බලපෑම්
- ★ අන්තවාදී හැඟීම්.
- ★ සතුරන්ගේ කුමන්ත්‍රණ.
- ★ මිත්‍යා විශ්වාස යන හේතූන් නිසා අකීදාවේ සරල ගතිය නැති විය.

(කරුණු පහක් තිබේනම් ලකුණු පහයි)

03 (i) නබි (සල්) තුමාට වහි පහළ වන අවස්ථාවේ වහි සටහන් කරන්නෝ ''කුත්තාබුල් වහි'' යැයි අමතනු ලැබූහ.

(ii) නබිනායකතුමාගේ වෆාතයෙන් පසුව අබුබක්කර් (රලි) තුමා කලීෆා ලෙස පදවි ප්‍රාප්ත වූ විට මුතනබ්බිවරු මුර්තද්වරු යමාම නම් ස්ථානයේ දී සටනක් සිදුවිය එහිදී හැත්තෑවකට අධික හාෆිල්වරු ෂහීද් වූහ. මෙම අවස්ථාවේ උමර් (රලි) තුමාගේ උපදෙස් පරිදි අල්කුර්ආන් පොතක් වශයෙන් ගොනුකරන ලදී. නබිතුමාට පහළ කළ අල්කුර් ආනය අවසන් රමලාන මාසයේ ජිබ්රීල් (අලෛ) තුමා විසින් පරීක්ෂා කරන ලදී. එවිට සයිද් ඉබුනු සාබිත් (රලි) තුමා එයට සවන් දුන්නේ ය. එම නිසා කලීෆා අබුබක්කර් (රලි) තුමාගේ කාලයේ අල්කුර්ආනය ගොනුකිරීමේ වගකීම මොහුට පැවරිය.

04 (i) සකාතයේ ෆර්ලු දෙකකි,

1) තියියත් තැබීම    2) සදුස්සාට ලබා දීම

(ii) ෆකීර්, මිස්කීන්, ආමිල්, මුඅල්ලෆකුල් කුලුබ් අර් රිකාබ්, කාරීමූන්, ෆීසබීලිල්ලාහ, ඉබුනු සබීල් (මේවාගේ අර්ථය ලියා තිබුණත් ලකුණු දෙන්න.)

(iii)
- ★ ධනවතුන් කිසිවකුටත් සකාත් වගකීමෙන් මිදී නොසිටිමට මග පෙන්වයි.
- ★ දුගීන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කරන්නේ ය.
- ★ දුගීබව නැති කිරීමට විශාල වැඩසටහන් ක්‍රමවත් ව සැලසුම් කිරීමට හැකි වීම.
- ★ සකාත් පිළිබඳව සැලකිය යුතු සියල්ලන්ගේ ම අවධානයට යොමුකරගත හැකි විම.
- ★ සමාජ යහපත රකින සේවාවන්වල අවධානය යොමු කරවා ගත හැකිය.

05 (i) නබි (සල්) තුමාගේ වෆාතයෙන් පසුව පාලනය කළ සහබාවරු හතර දෙනා අල්කුලපාඋර් රාසිදූන් යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ii) වීරත්වය (ධෛර්ය) විශාල දනුම, දක්ම, බුද්ධිය යන යහ ගුණයන් පැහැදිලි කරන ක්‍රියාවන් තුනක් පැහැදිලි කර තිබේ නම් ලකුණු 03 ක් දෙන්න.

(iii)
- ★ නබිතුමාගේ වෆාතයෙන් පසුව කිලාපත් නායා භාර ගැනීම.
- ★ ව්‍යාජ නබිවරුන්ගේ අභියෝග පරාජය කිරීම.
- ★ සකාත් දීම ප්‍රතික්ෂේප කළ පිරිසගේ කුමන්ත්‍රණය බිඳ දැමීම.
- ★ අල්කුර්ආනය ගොනු කොට ග්‍රන්ථාරූඪ කිරීම.
- ★ දේශපාලන අත්දැකීම් සහිත ආණ්ඩුකාරවරුන් පත්කොට පාලනය ස්ථාවර කිරීම.
- ★ දේශ සීමාවල සිටි පාලකයන් නිසා ඉස්ලාමීය රජයට පැවති බලපෑම් අවමකර ගැනීම.
- ★ තමාගෙන් පසු කලීෆා ලෙස කටයුතු කිරීමට වඩාත් සුදුසු අයකු පත් කිරීම.

06 (i) 1. සාලිත් වූ පරපම්පරාව බිහිකිරීම 2. කායික හා මානසික ශාන්තිය ඇති කිරීම
3. හොඳ සමාජ ක්‍රමය ඇති කිරිම.

(ii) මනමාලයා, මනමාලි, ඊජාබ් කබූල්, වලී සාක්ෂිකරුවන් යනු කරුණුවලින් තුනක් කෙටියෙන් ලියා තිබේනම් ලකුණු 03 ක් ලබා දෙන්න.

(iii) රුවටීම, අසත්‍ය දිවුරීම, සැඟවීම, පොලිය, හරාම් භාණ්ඩ මිලදී ගැනීම, විකිණීම වන කරුණු කෙටියෙන් පැහැදිලි කළොත් ලකුණු 05 යි.

07 (i)
- ★ මස්ජිදුන් නබවියේ ඉතිහාසය හිජ්රත් ගමනින් ඇරඹේ.
- ★ තමාගේ ඔටුවා පළමුව හිඳගත් ස්ථානය
- ★ සහ්ල්, සුහයිල් යන අනාථයන් දෙදෙනෙකුට අයිතිව තිබූ ඉඩම මිල දී ගැනීම.
- ★ නබි තුමාගේ කාලයේ මෙම විවිධ සහභාගීත්වය සම්බන්ධව ලියා ඇත්නම් ලකුණු 05 යි.

(ii)
- ★ තස්කියා යනු තස්කියකුන් නෆ්ස් යනුවෙන් හඳුන්වා හිත පාරිශුද්ධියකිරීම.
- ★ සිතෙහි (නබිසිහි) තත්ත්වයන් තුනක් ලියන්න.
- ★ ''නබ්ස්'' සම්බන්ධයෙන් අල්කුර්ආන්, හදීස් වචන පැහැදිලි කර තිබේ නම් ලකුණු 05 යි.

(iii) ජලයේ වැදගත්කම
- ★ ජලයේ කොටස්
- ★ ඉතා පිරිසිඳු ජලය (මුහුද, වැව)
- ★ පිරිසිඳු ජලය (තේ, සුවඳ විලවුන්)
- ★ අපිරිසිඳු ජලය (මුත්‍රා, මත්පැන්)

(iv) ඉස්ලාම් පිළිගැන් වූ මානව අයිතිවාසිකම්
1) ජීවත්වීමේ අයිතිය.
2) සමානාත්මතා අයිතිය.
3) පෞද්ගලික නිදහසේ අයිතිය.
4) නීතියේ පිහිට ලබා ගැනිමේ අයිතිය.
5) ගෞරවය ආරක්ෂා කර ගැනීමේ අයිතිය.
6) දේපළ ආරක්ෂා කිරීමේ අයිතිය.
7) ආගමික හැඟීම්වලට ආරක්ෂාව ලබා දීමේ අයිතිය.

මෙහි කුමන හෝ අයිතිවාසිකම් 05 ක් සම්බන්ධව පැහැදිලි කළේ නම් ලකුණු 04 යි.